ජනාධිපති කාර්යාලය
சனாதிபதி அலுவலகம்
PRESIDENTIAL SECRETARIAT

මගේ අංකය : පීඑස්/සීඑස්ඒ/00/1/9/1 චක්‍රලේඛ අංක : පීඑස්/එස්පී/චක්‍රලේඛ/28/2020

2020 අගෝස්තු මස 24 වන දින

**සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්**

**සියළුම රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන් වෙත,**

**තනතුරු අහෝසි වූ කැබිනට් අමාත්‍යාංශ ලේකම්වරුන් හා**
**රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන් සඳහා සහන සැලසීම**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන ප්‍රකාරව අමාත්‍ය මණ්ඩලය විසිරීම හේතුවෙන් සිය ධුරයන් අහිමි වූ කැබිනට් අමාත්‍යාංශ ලේකම්වරුන්ගේ හා රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන් ගේ සේවය ඇගයීමක් වශයෙන් විශේෂ සහනදායී විකල්ප පිළිවෙතක් සැපයීම පිණිස අතිගරු ජනාධිපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද අංක : 20/1189/301/003 හා 2020.08.18 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශයේ සඳහන් යෝජනාවන් සඳහා 2020.08.19 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබාදී ඇත.

ඒ අනුව මේ අවස්ථාවේදී ධුරය අහිමි වූ,

1. කැබිනට් අමාත්‍යාංශ ලේකම්වරුන්

   i. ලේකම්වරුන් ගේ ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන යටතේ විශ්‍රාම ගන්නා තෙක් හෝ සිය පූර්ව සේවාවේ තනතුරකට හෝ වෙනත් සුදුසු තනතුරකට පත්කරනු ලබන තෙක් හෝ රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත අනුයුක්ත කිරීමටත්,

   ii. ලේකම්වරුන් ගේ ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන යටතේ විශ්‍රාම ගැනීමට අදහස් කරනු නොලබන නිලධාරීන්, 2020.08.31 දිනට පෙර සුදුසු තනතුරකට පත්කිරීමටත්, එසේ විශ්‍රාම ගනු ලබන දිනය හෝ සුදුසු තනතුරකට පත්කරනු ලබන දිනය හෝ 2020.08.31 යන දිනයන්ගෙන් කලින් එළඹෙන දිනය දක්වා, තමා දැරූ තනතුරට අනුමත එතෙක් ලබා ගත් වැටුප්, දීමනා හා අනෙකුත් වරප්‍රසාද සියල්ල ලබා දීමට රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් වෙත නියම කිරීමටත්,

   iii. පූර්ව සේවාවට නැතහොත් ධුරයට ආපසු යනු ලබන අවස්ථාවකදී, දැනට වාහන ආනයනය කිරීම සඳහා වන රජයේ ප්‍රතිපත්තියට යටත්ව තීරුබදු සහන සහිත 1වන පන්තියේ වාහන ආනයන බලපත්‍රය ලබා ගැනීමට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 22/99 (XXXI) හි (04) දැක්වෙන වසර 03 ක සීමාව මෙම නිලධාරීන් සඳහා වසර 01 ක් දක්වා අඩු කිරීමටත්,

ගාලු මුවදොර, කොළඹ 01 / காலி முகத்திடல், கொழும்பு 01 / Galle Face, Colombo 01
දුරකථන / தொலைபேசி / Telephones ++ 94 (0) 11 2354418, ++ 94 (0) 11 2473873
ෆැක්ස් / தொலைநகல் / Fax ++ 94 11 2446657
ඊ-තැපැල / மின்னஞ்சல் / e-mail prsec@presidentsoffice.lk

2. රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන්

2020.06.03 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී එළඹී තීරණය පරිදි එවකට සිටි රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන් අදාළ ධුරයේ රාජකාරි සහ කොවිඩ් - 19 තත්ත්වය යටතේ පැවති හදිසි රාජකාරී ඉටු කරමින් රාජ්‍ය අමාත්‍යාංශ ලේකම් ධුරයට හිමි වැටුප්, දීමනා හා වරප්‍රසාද සඳහා හිමිකම් ලැබූ බව සැලකිල්ලට ගනිමින්,

i. අනිවාර්ය විශ්‍රාම ගැනීමේ වයසට එළඹීමට ඇති ඉතිරි සේවා කාලය නව අමාත්‍ය මණ්ඩලය පත්වූ දින සිට ඉදිරියට වසරක් හෝ ඊට වඩා අඩුවන්නේ නම් නිලධාරියා ගේ අභිමතය පරිදි, එතෙක් තමා ලබා ගත් වැටුප, දීමනා සහ වරප්‍රසාද සහිතව ඔවුන් ගේ වයස අවුරුදු 60 දක්වා සේවයේ යෙදුණා සේ සලකා විශ්‍රාම ගැනීමට අනුමැතිය ලබාදීමටත්,

ii. අමාත්‍ය මණ්ඩල තීරණ මගින් ලබා දී ඇති විශේෂ ප්‍රතිපාදන යටතේ විශ්‍රාම ගන්නා තෙක් හෝ සිය පූර්ව සේවාවේ තනතුරකට හෝ වෙනත් සුදුසු තනතුරකට පත්කරනු ලබන තෙක් හෝ රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත අනුයුක්ත කොට, තනතුරට අනුමත එතෙක් තමා ලබා ගත් වැටුප්, දීමනා හා අනෙකුත් වරප්‍රසාද සියල්ල එම අමාත්‍යාංශය මගින් 2020.08.31 දින හෝ වෙනත් තනතුරකට පත්කරනු ලබන දින හෝ අමාත්‍ය මණ්ඩල තීරණයේ ප්‍රතිපාදන අනුව විශ්‍රාම ගන්නා දිනය යන දිනයන්ගෙන් මුලින් එළඹෙන දින දක්වා ලබා දීමට සහ 2020.08.31 දිනට පෙර එකී නිලධාරීන් සුදුසු තනතුරකට පත්කිරීමට පියවර ගන්නා ලෙස, රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් වෙත නියම කිරීමටත්,

iii. එසේ සුදුසු තනතුරකට පත්කිරීමෙන් පසුව වුව ද රාජ්‍ය අමාත්‍යාංශ ලේකම් ධුරයේ සේවය කල කාල සීමාව නොසලකා අදාල වැටුප් පරිමාණය රඳවා තබා ගැනීමට අවසර ලබා දීමටත්,

iv. මාස 06ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති තනතුරු අහිමි වූ රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන් සඳහා පමණක් රු. 25,000.00 ක දීමනාව රඳවා ගැනීමට අවසර ලබා දීමටත්,

තීරණය කර ඇත.

එබැවින්, උක්ත විධිවිධානයන්ට අනුකූලව ඉදිරි කටයුතු සිදු කරන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

**පී.බී. ජයසුන්දර**
ජනාධිපති ලේකම්

පිටපත් :

| | | |
|---|---|---|
| 1. | අග්‍රාමාත්‍ය ලේකම් | කරු. දැන ගැනීම සහ අවශ්‍ය කටයුතු සඳහා |
| 2. | අමාත්‍ය මණ්ඩල ලේකම් | |
| 3. | විගණකාධිපති | |
| 4. | විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් | |